**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 2024.03.11

පැමිණිලි පාර්ශවය : K.R.I.ක්‍රිෂාන්ති මිය,
නො.48/108, ඇසළ උයන,
රාජගිරිය.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පති,
නාලන්දා විදුහල,
කොළඹ 10.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්‍රමුල්ල.

**පැමිණිලි අංකය : HRC/1584/23**

**පැමිණිල්ල සහ ඉල්ලා සිටින සහනය :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, තම දරුවා වන සෙනුත් හෙම්සිත ශිෂ්‍යයා නාලන්දා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.03.03 දිනැති ලිපිය මඟින් නාලන්ද විදුහලේ විදුහල්පතිවරයා වෙත දන්වා ඇති බවත්, 2023.03.24 දින පැමිණිලිකාරිය තම දරුවා නාලන්දා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කිරීමට ගිය අවස්ථාවේදී විදුහල්පතිවරයා විසින් දරුවා පාසලට ඇතුළත් කර ගැනීමට නොහැකි බව දන්වන ලද බවත් සඳහන් කර ඇත. නමුත් එදිනම තවත් දරුවෙක් 4 ශ්‍රේණියට ඇතුළත් කිරීම හරහා පැමිණිලිකාරියගේ දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින් කරුණු සලකා බලා තම දරුවා නාලන්දා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස නිර්දේශ කරන මෙන් ඉල්ලා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
දුරකථන
ලේකම්
ක්ෂණික
වෙබ්

**පළමු වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

අධ්‍යාපන ලේකම් විසින් අනුමත කරන ලද 2023.03.03 දිනැති අංක ED/08/01/01/01WP/CO/04 දරණ ලිපිය 2023.03.10 දින ලියාපදිංචි තැපැලෙන් නාලන්දා විද්‍යාලයට ලැබී ඇති අතර, එම ලිපිය තහවුරු කරගැනීම සඳහා 2023.03.23 දින අමාත්‍යාංශ ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලද නමුත් එකී ලිපිය තහවුරු කිරීමෙන් පසුව නැවත නාලන්දා විද්‍යාලය වෙත නොලැබුනු බැවින් පැමිණිලිකාරියගේ දරුවා ඇතුළත් කිරීම සම්බන්ධව ගැටළු සහගත තත්වයක් පැන නැගුණු බැවින් එම ඇතුළත් කිරීම සිදු නොකළ බවට විදුහල්පතිවරයා විසින් කරුණු දක්වා ඇත.

**2023.06.15 දින දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් පැවති පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු :-**

පැමිණිලිකාරියගේ දරුවා නාලන්දා විදුහලේ 4 ශ්‍රේණියට ඇතුළත් කිරීමට අවශ්‍ය අනුමැතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.03.03 දිනැති අංක ED/08/01/01/01WP/CO/04 දරණ ලිපියෙන් නාලන්දා විද්‍යාලයේ විදුහල්පති වෙත දන්වා ඇති බවත්, එම ලිපිය මඟින් දරුවා පාසලට ඇතුළත් කර ගැනීමට පෙර අදාළ තොරතුරුවල නිරවද්‍යභාවය පරීක්ෂා කරන ලෙස උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව පාසල විසින් උක්ත ලිපිය තහවුරු කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇතත්, අමාත්‍යාංශය විසින් පාසලට පිළිතුරක් ලබා දී නොමැති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව, මෙම කාරණය පිළිබඳව නැවත අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කරන ලෙසත් දරුවා ඇතුළත් කිරීම සඳහා ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය තහවුරු කර ගැනීමට කටයුතු කරන ලෙසත් උක්ත පරීක්ෂණයේදී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පළමු වගඋත්තරකරු වෙත දැනුම් දී ඇත.

2023.12.19 දින දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් යුතුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පවත්වන ලද පරීක්ෂණයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරීන් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදී ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2023.03.03 දිනැති අංක ED/08/01/01/01WP/CO/04 දරණ ලිපිය අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද්දක් ද යන්න පරීක්ෂා කර බලා දැනුම්දෙන ලෙසයි.

**නිරීක්ෂණ :-**

01. පැමිණිලිකාරියගේ දරුවා වන සෙනුත් හෙම්සිත ශිෂ්‍යයා නාලන්දා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කිරීම අනුමත කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නාලන්දා විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත යොමු කළ 2023.03.03 දිනැති අංක ED/08/01/01/01WP/CO/04 දරණ ලිපිය 2023.03.10 දින වන විට නාලන්දා විද්‍යාලයට ලැබී ඇති නමුත්, එකී ලිපිය තහවුරු කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත්තේ 2023.03.23 දින බව නිරීක්ෂණය වේ.

තවද උක්ත ලිපිය මගින්, 'අදාළ ලිපිය ෆැක්ස් මගින් අධ්‍යාපන ලේකම් කාර්යාලය වෙත යොමු කර නිවැරදිභාවය තහවුරු කර ගන්නා ලෙසට' දන්වා ඇත. එහෙත් වගඋත්තරකාර පාසලේ විදුහල්පතිවරයා විසින් 2023.03.23 දින අදාළ ලිපිය ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

02. 2023.12.19 දින දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් යුතුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පවත්වන ලද පරීක්ෂණයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරීන් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදුන් පරිදි, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2023.03.03 දිනැති අංක ED/08/01/01/01WP/CO/04 දරණ ලිපිය අමාත්‍යාංශ ලේකම් කාර්යාලය මගින් නිකුත් කරන ලද්දක් බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ ශාඛා ප්‍රධානී විසින් 2023.12.22 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ෆැක්ස්පතක් යොමු කරමින් තහවුරු කර ඇත.

කෙසේ නමුත් නාලන්දා විදුහලේ විදුහල්පතිවරයා ඒ වනතෙක් උක්ත සඳහන් ලිපිය තහවුරු කර ගැනීමට අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඉහත සඳහන් නිරීක්ෂණවලට අනුව පැමිණිලිකාරියගේ දරුවා වන සෙනුත් හෙම්සිත ශිෂ්‍යයා නාලන්දා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.03.03 දිනැති අංක ED/08/01/01/01WP/CO/04 දරණ ලිපිය මගින් නාලන්දා විද්‍යාලයේ විදුහල්පතිවරයාට දැනුම්දී තිබියදීත්, උක්ත ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර තහවුරු කර ගැනීමට ප්‍රමාද වීම හරහා පැමිණිලිකාරියගේ දරුවාට වගඋත්තරකාර පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇත. එමෙන්ම අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉහත කී ලිපියෙහි පිටපතක් අධ්‍යාපන ලේකම්කාර්යාලයේ ෆැක්ස් අංකයට (0112785162) යොමුකර නිවැරදිභාවය තහවුරු කරගන්නා ලෙස එකී ලිපියේම උපදෙස් ලබා දී තිබියදී අදාළ ලිපිය 2023.03.10 දින ලැබී තිබියදී හා ෆැක්ස් මගින් එය තහවුරු කරගන්නා ලෙස ලිපියේම සඳහන් කොට ෆැක්ස් අංකයද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සඳහන් කර තිබියදීත්, එම ලිපිය ලියාපදිංචි තැපෑලෙන් යොමු කර තිබීමද හිතාමතා මෙය ප්‍රමාද කිරීමට ගත් උත්සහයක් ලෙස පෙනී යයි. මේ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

පැමිණිලිකාරියගේ දරුවා වන සෙනුත් හෙම්සිත ශිෂ්‍යයා නාලන්දා විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කිරීම අනුමත කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නාලන්දා විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත යොමු කළ 2023.03.03 දිනැති අංක ED/08/01/01/01WP/CO/04 දරණ

ලිපිය අමාත්‍යාංශ ලේකම් කාර්යාලය මගින් නිකුත් කරන ලද්දක් බව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තහවුරු කර ඇති බැවින් උක්ත ශිෂ්‍යයා නාලන්දා විද්‍යාලයේ සමාන්තර පන්තියකට ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

2024.04.22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. සුසිල් ප්‍රේමජයන්ත මහතා,
ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/